කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
கொழும்புப் பல்கலைக்கழகம், இலங்கை
UNIVERSITY OF COLOMBO, SRI LANKA

තැපැල් පෙට්ටි අංකය
தபால் பெட்டி இல
P.O. Box No. } 1490

94, කුමාරතුංග මුනිදාස මාවත,
කොළඹ 03, ශ්‍රී ලංකාව
94, குமாரதுங்க முனிதாச மாவத்தை,
கொழும்பு 03, இலங்கை
94, Cumaratunga Munidasa Mawatha,
Colombo 03, Sri Lanka


අපේ අංකය / Our Ref. No.:
ඔබේ අංකය / Your Ref. No.:

EX/M/2021/ UG-1

2021 මාර්තු 22

ප්‍රිය උපාධිලාභිනි,

**සාමාන්‍ය උපාධි සැමරුම් උත්සවය - 2019**
**2021 මැයි මස 04, 05, 06**

උක්ත කරුණ සම්බන්ධ මගේ යොමු අංක EX-M/2020/6 හා 2020/12/17 දාතම දරන ලිපිය හා බැඳේ.

බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පාලනාධිකාරිය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලබාගත් සෞඛ්‍ය නිෂ්කාශන පිළිවෙත් පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව කොළඹ විශ්වවිද්‍යාලයේ 2019 උපාධි ප්‍රදානෝත්සවය **2021 මැයි මස 04, 05 සහ 06** යන දිනවල බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී (BMICH) පැවැත්වීමට විශ්වවිද්‍යාල බලධාරීන් විසින් තීරණය කර ඇති බව ඔබේ අවධානයට යොමු කිරීමට කැමැත්තෙමි.

උපාධි ප්‍රදානෝත්සවයේදී සියලුම උපාධිලාභීන් සහ ඔවුන්ගේ අමුත්තන් මුහුණු ආවරණ පැළඳිය යුතු අතර සියලුම සෞඛ්‍ය හා ආරක්ෂක මාර්ගෝපදේශ අනුගමනය කරන ලෙස මෙයින් දන්වා සිටිමි. ප්‍රධාන වෛද්‍ය නිළධාරි (සී.එම්.ඕ) විසින් නිකුත් කරන ලද කොවිඩ් - 19 සෞඛ්‍ය මාර්ගෝපදේශ ඔබගේ අවධානය පිණිස මෙහි අමුණා ඇත.

පහත සඳහන් පරිදි අදාළ සැසි පැවැත්වෙනු ඇත:

**2021 මැයි 04** වන අඟහරුවාදා

| සැසිය | වේලාව | පීඨය/ ආයතනය |
|---|---|---|
| I සැසිය | පෙ.ව. 08.00 | ශාස්ත්‍රවේදී උපාධිය (අධ්‍යයන ධාරා ), ඉතිහාසය, ජාත්‍යන්තර සම්බන්ධතා සහ සමාජවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධි ( ශිෂ්‍යයන් 100). |
| II සැසිය | පෙ.ව. 10.30 | බෞද්ධ අධ්‍යයනය, ප්‍රජා විද්‍යාව, ආර්ථික විද්‍යාව, ඉංග්‍රීසි, භූගෝල විද්‍යාව, දේශපාලන විද්‍යාව හා රාජ්‍ය ප්‍රතිපත්ති සහ සිංහල පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධි (ශිෂ්‍යයන් 258). |
| III සැසිය | ප.ව. 01.30 | අධ්‍යාපනවේදී උපාධිය<br>ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය |
| IV සැසිය | ප.ව. 03.30 | වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී උපාධිය<br>විද්‍යාවේදී භෞතචිකිත්සක ගෞරව උපාධිය<br>සෞඛ්‍ය අධ්‍යාපනවේදී උපාධිය |




දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos.

General
94 11-258 1835
94 11-258 4695
94 11-258 5509

Vice Chancellor
Tel: 94 11-258 3810
Fax: 94 11-258 6059
E-mail: vc@cmb.ac.lk

Registrar
Tel: 94 11-258 3818
Fax: 94 11-255 3188
E-mail: registrar@cmb.ac.lk

Bursar
Tel: 94 11-258 6652
Fax: 94 11-255 6652
E-mail: bursar@cmb.ac.lk

Examination Branch
Tel: 94 11-204 7031
Fax: 94 11-208 1028

Deputy Registrar (Examinations)
Tel: 94 11-258 5972 / 94 11-204 7030
Fax: 94 11-208 1028
E-mail: dr@exam.cmb.ac.lk

Deputy Registrar (Registration)
Tel: 94 11-250 0712 / 94 11-204 7033
Fax: 94 11-208 1028
E-mail: suneetha@admin.cmb.ac.lk

**2021 මැයි 05** වන බදාදා

| සැසිය | වේලාව | පීඨය/ ආයතනය |
|---|---|---|
| I සැසිය | පෙ.ව. 08.00 | නීතිවේදී උපාධිය |
| II සැසිය | පෙ.ව. 10.30 | ආයුර්වේද වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍යවේදී උපාධිය<br>යුනානි වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍යවේදී උපාධිය<br>කෘෂි තාක්ෂණවේදී උපාධිය |
| III සැසිය | ප.ව. 01.30 | ප්‍රසංග කලා ශාස්ත්‍රවේදී උපාධිය, ජනමාධ්‍ය ශාස්ත්‍රවේදී උපාධිය<br>විද්‍යාවේදී උපාධිය |
| IV සැසිය | ප.ව. 03.30 | විද්‍යාවේදී ගෞරව උපාධිය |

**2021 මැයි 06** වන බ්‍රහස්පතින්දා

| සැසිය | වේලාව | පීඨය/ ආයතනය |
|---|---|---|
| I සැසිය | පෙ.ව. 08.00 | විද්‍යාවේදී පරිගණක විද්‍යා උපාධිය<br>විද්‍යාවේදී තොරතුරු පද්ධති උපාධිය<br>විද්‍යාවේදී පරිගණක විද්‍යා ගෞරව උපාධිය<br>විද්‍යාවේදී මෘදුකාංගඉංජිනේරු ගෞරව උපාධිය<br>විද්‍යාවේදී තොරතුරු පද්ධති ගෞරව උපාධිය |
| II සැසිය | පෙ.ව. 10.30 | ගිණුම්කරණය, මූල්‍යකරණ හා ජාත්‍යන්තර ව්‍යාපාර ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය |
| III සැසිය | ප.ව. 01.30 | ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය, ව්‍යාපාර ආර්ථික විද්‍යා, ආගන්තුක සත්කාර හා විවේක කළමනාකරණ, මානව සම්පත් කළමනාකරණ හා අලෙවිකරණ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය |

උපාධිලාභී ශිෂ්‍ය කණ්ඩායමේ නියෝජිතයන් සමඟ විශ්වවිද්‍යාල කළමණාකාරිත්වය පැමිණි එකඟතාවන්ට අනුව, උපාධිලාභීන් විසින් උපාධි ප්‍රදානෝත්සව ගාස්තුව සහ ආපසු ගෙවනු ලබන උපාධි ලෝගු ගාස්තුව ලෙස පිළිවෙලින් රුපියල් 3200 සහ රු .2500 වශයෙන් එක් ශිෂ්‍යයෙකුට රු. 5700 ක මුලු මුදලක් ගෙවිය යුතුය.

COVID19 ආශ්‍රිත අවදානම් සැලකිල්ලට ගනිමින්, අවශ්‍ය සියලු තොරතුරු නිවැරදිව අදාළ අන්තර්ජාල වෙබ් අඩවියට ඉදිරිපත් කර 2021/04/20 දින හෝ ඊට පෙර අන්තර්ජාලය හරහා **මාර්ගගතව** ගෙවීම් කිරීමට පහසු ක්‍රමයක් අප විසින් අපගේ උපාධිලාභීන්ට ලබා දී ඇත. වෙබ් අඩවිය (https://sis.cmb.ac.lk/ag/ugconvocation)

ඔබගේ උපාධි ලෝගුව සහ පළඳනාව ආපසු ලබා දීමෙන් පසු මුදල් ආපසු ගෙවීමට විශ්වවිද්‍යාලයට හැකි වන පරිදි ඔබේ බැංකු ගිණුම් විස්තර නිවැරදිව ඇතුළත් කරන ලෙස ඔබට මෙයින් උපදෙස් දෙනු ලැබේ.

උපාධිධාරීන් විසින් **2021 අප්‍රේල් මස 28, 29 සහ 30** යන දිනවල පෙ.ව. **9.00** හා ප.ව. **4.00** අතර කාලයේදී අදාළ පීඨයේ,ආයතනයේ, මණ්ඩපයේ හෝ පාසලේ පරිපාලන නිළධාරීන් වෙතින් තම උපාධි ලෝගුව සහ පළඳනාව ලබාගත යුතුය.

ඉහත සඳහන් දෑ ලබා ගැනීම සඳහා සෑම උපාධිධාරියකු විසින්ම පහත සඳහන් ලේඛන ඉදිරිපත් කළ යුතුය:

i. ශිෂ්‍ය හැඳුනුම්පත **නැතහොත්** වලංගු හැඳුනුම්පතක්
ii. නිසි පරිදි පුරවන ලද ප්‍රකාශ පත්‍රය.(ඉහත වෙබ් සබැඳියෙන් බාගත කරන ලද)
iii. උපාධි ප්‍රදානෝත්සව ගාස්තුව සහ ආපසු ගෙවනු ලබන උපාධි ලෝගු ගාස්තුව ගෙවූ ලදුපත
iv. උපාධි ලෝගුව සහ පළඳනාව ලබා ගැනීමට පෙර මාර්ගගත රැකියා නියුක්තිය පිළිබඳ ප්‍රතිපෝෂණ ආකෘතිය (Employability Feedback Form -online) පුරවා භාරදිය යුතුය.

ඔබ අයත් වන සැසි වාරයට සහභාගි වීම සඳහා **<u>අමුත්තන් වෙනුවෙන් ප්‍රවේශපත්‍ර දෙකක්</u>** ඔබ වෙත නිකුත් කෙරෙනු ඇත. ඉහත I, II, III හා IV සැසිවලදී උපාධිය ලබන උපාධිලාභීන් සහ ඔවුන්ගේ අමුත්තන් පහත දැක්වෙන වේලාවන්හිදී බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පිවිසුම් දොරටුව අබියස රැස්ව සිටිය යුතුය.

| | | |
|---|---|---|
| **I සැසිය** | - | **පෙ.ව. 08.00** |
| **II සැසිය** | - | **පෙ.ව. 10.30** |
| **III සැසිය** | - | **ප.ව. 01.30** |
| **IV සැසිය** | - | **ප.ව. 03.30** |

උපාධි ප්‍රදානෝත්සවයෙහි අදාළ සැසිවාරයෙහිදී ඔබට අදාළ උපාධිය පිරිනැමීම සඳහා විශ්වවිද්‍යාලයෙහි කුලපතිතුමා අභිමුඛයට ඔබ ඉදිරිපත් කෙරෙනු ඇත.

<u>විශේෂ සටහන</u>:

1. **නියමිත වේලාවටම අදාළ ස්ථානයට පැමිණෙන ලෙස උපාධිධාරීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. අදාළ උපාධි පෙරහැරවල් සකස් වීමෙන් පසුව පැමිණෙන උපාධිලාභීන්ට උපාධි ප්‍රදානෝත්සවයෙහි උපාධි ලැබීමේ අවස්ථාව අහිමිවනු ඇත.**

2. රැස්වීම් ශාලාවෙහි ප්‍රධාන දොරටුවෙන් ඔබව ශාලාව වෙත ඇතුළු කරනු ලබන අතර උපාධි ප්‍රදානෝත්සව පොතෙහි ඔබ හට නියමිතව ඇති අංකයට අනුව අසුන්ගත යුතුය. ඔබ අයත් මණ්ඩපයෙහි මණ්ඩපාධිපති/ පීඨයෙහි පීඨාධිපති/ ආයතනයෙහි අධ්‍යක්ෂ විසින් ඔබගේ නම කියවන ලද විට කුලපතිතුමා විසින් ඔබ වෙත උපාධිය පිරිනැමීම වස් ඔබ එතුමා අභිමුඛයට ඉදිරිපත් වියයුතුය. ඔබ වෙත උපාධිය පිරිනමනු ලැබීමෙන් පසුව ඔබ ශාලාවේ පෙර සිටි අසුනේම අසුන්ගත යුතුය.

3. උපාධි ප්‍රදානෝත්සව ශාලාව තුළ ඡායාරූපගත කිරීම් සිදු කිරීමට අවසර නොමැති බව කාරුණිකව සලකන්න. **කැමරා, සෙලියුලර් දුරකථන හා වෙනත් විද්‍යුත් උපාංග ගෙන ඒමට අවසර නොලැබේ. වයස අවුරුදු 12 ට අඩු ළමුන් හට ශාලාවට ඇතුළු වීමට ඉඩ නොලැබේ.** විශ්වවිද්‍යාලය විසින් එදිනට නිල ඡායාරූප ශිල්පියෙකුගේ සේවාව ලබා ගැනේ. උපාධි ලෝගුව ලබා ගැනීමට විශ්වවිද්‍යාලයට පැමිණීමේදී ඔබට එම ඡායාරූප ශිල්පියා සමග අවශ්‍ය ඡායාරූප පිළිබඳ කටයුතු සම්පාදනය කර ගත හැකිය.

4. ඔබ විසින් ලබා ගන්නා ලද උපාධි ලෝගුව සහ පළඳනාව උපාධි ප්‍රදානෝත්සවයෙන් පසු **2021 මැයි 13 වන දින හෝ ඊට පෙර ඔබ අයත් පීඨයෙහි / ආයතනයෙහි/ පාසලෙහි සහ මණ්ඩපයෙහි සහකාර ලේඛකාධිකාරී/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී /නියෝජ්‍ය ලේඛකාධිකාරී වෙත** නැවත භාරදීම අනිවාර්ය වේ. නියමිත දිනයෙහි උපාධි ලෝගුව සහ පළඳනාව භාර නොදෙන ලද නම් දිනකට රු. **100/= බැගින් වූ දඩ මුදලක් අය කෙරෙනු ඇත. එම මුදල විශ්වවිද්‍යාලයේ ප්‍රධාන රැස්කිරීම් ගිණුමට ගෙවියයුතුය. ගිණුම් විස්තර වෙබ් සබැඳියේ දැක්වේ.**

5. සම්පාදිත පූර්ව විධිවිධාන අනුව, ඔබේ උපාධි සහතිකය ඔබේ **පීඨය / ආයතනය/ පාසල හෝ මණ්ඩපය** වෙතින් ලබා ගත හැකිය. **ඔබ ශිෂ්‍ය හැඳුනුම්පත භාරදෙන තෙක් කවර හේතුවක් නිසා හෝ උපාධි සහතිකය නිකුත් නොකෙරේ.**

6. පුරුෂ පක්ෂය ජාතික ඇඳුම හෝ කොලරය සහ කරපටිය සහිත බටහිර ඇඳුමින් සැරසී පැමිණිය යුතු අතර කාන්තා පක්ෂය වර්ණවත් සාරිවලින් සැරසී පැමිණීම අපේක්ෂා කෙරේ.

7. සහභාගී වන සියලුදෙනාගෙන්ම (උපාධිලාභීන් හා අමුත්තන් දෙපිරිසම) උපාධි ප්‍රදානෝත්සවයෙහි කටයුතු අවසන් බවට නිල වශයෙන් නිවේදනය කෙරෙන තෙක් සිය අසුන්වලම රැඳී සිටීම මගින් මෙම අවස්ථාවෙහි ගෞරවය හා ගාම්භීරත්වය පවත්වා ගැනීමට අපගේ විශ්ව විද්‍යාලයට සහය වන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

8. පවතින සීමිත ආසන ප්‍රමාණය සැලකිල්ලට ගෙන, ඔබේ අමුත්තන්ට නියමිත වේලාවටම පැමිණ ශාලාව තුළ ඔවුන්ගේ ආසනවල අසුන් ගන්නා ලෙස උපදෙස් දෙනු ලැබේ.

මෙම උපාධි ප්‍රදානෝත්සවය අනුස්මරණීයව හා මනා සංවිධානයකින් යුතුව පැවැත්වීම සඳහා ඉහත උපදෙස් තරයේ අනුගමනය කිරීමට වග බලා ගනිමු.

ඔබට සුබ පැතුම්!
මීට විශ්වාසී,

මහාචාර්ය චන්ද්‍රිකා එන්. විජයරත්න
උප කුලපති
කොළඹ විශ්වවිද්‍යාලය

කේ.ඒ.එස්. එඩ්වඩ්
ලේඛකාධිකාරී

පිටපත් මණ්ඩපාධිපති
පීඨාධිපතිවරුන්
අධ්‍යක්ෂවරුන්
පුස්තකාලයාධිපති
මූල්‍යාධිකාරී
ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය අනුශාසක
පීඨ / ආයතනය/ පාසල හෝ මණ්ඩපවල ප්‍රධාන පරිපාලන නිලධාරීන් (සහ. ලේඛකාධිකාරී/ ජ්‍යෙෂ්ඨ සහ. ලේඛකාධිකාරී හෝ නි. ලේඛකාධිකාරී)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / සාමාන්‍ය පාලන